# හඳගල කන්ද ගල්ලෙන් විහාරය පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

*කේ. සංජුක නයනජිත්* [1], *බී. ඒ. ධම්මික ලක්සිරි* [2]

හඳගල කන්ද ඓතිහාසික ක්ෂේත්‍රය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය මැතිවරණ බල ප්‍රදේශයේ රත්මල්ගහවැව නම් පුරාණ ග්‍රාමයේ පිහිටා ඇත. මැදවච්චිය සිට කැබිතිගොල්ලෑව නගරය පසු කරමින් හොරොව්පතාන මාර්ගය හරහාත්, මිහින්තලයේ සිට කහටගස්දිගිලිය මාර්ගය හරහාත්, රත්මල්ගහවැවට පැමිණ මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රයට පිවිසිය හැකි ය. හඳගල විහාර ක්ෂේත්‍රයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක විභවතා කවරාකාර ද? යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටළුව යි. උක්ත ක්ෂේත්‍රයේ ස්මාරක, පුරාවස්තු වාර්තා කිරීම හා සමාජ සන්නිවේදනය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙහි දී මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර දත්ත රැස් කිරීම සඳහා ඓතිහාසික මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා ජනශ්‍රැති විමර්ශනය ආදිය සිදු කරන ලදී. විහාර නාමයේ සඳහන් 'හඳගල' යන්න කෙසේ ව්‍යවහාරයට පැමිණියේ දැයි කිව නොහැකිමුත් ජනප්‍රවාද හා විද්වත් මත අනුව ප්‍රධාන මත දෙකක් නාමකරණය හා කාලය සිහි ගන්වයි. ඉන් පළමුවැන්න මෙය මහානාග යුවරජු විසින් කරන ලද 'චන්ද්‍රගිරි විහාරය' යන්න යි. දෙවැන්න විශුද්ධිමාර්ගයේ දැක්වෙන අතීත 'පාචීනඛණ්ඩරාජිනිය' යන්න යි. එච්. සී. පී. බෙල් මහතාගේ පාලන වාර්තා තුළත් එඩ්වඩ් මුලර් හා සී. ඩබ් නිකලස්ගේ වාර්තා තුළත් අවධානයට ලක්ව ඇති උක්ත ක්ෂේත්‍රය මුල් කාලීන භාවනායෝගී භික්ෂූන් වහන්සේලාගේ කේන්ද්‍රස්ථානයක් බවට සාක්ෂ්‍ය විද්‍යමාන ය. කටාරම් කොටා සකස් කරගත් ස්වභාවික ගල්ලෙන් 45ක් පමණ ඇති මෙහි පූර්ව බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ලෙන් ලිපි රාශියක් ද දැකගත හැකි ය. අනුරාධපුර අවධියේ සිතුවම් ශෛලිය විශද කරන සිතුවම් තලයක් ද මහ ලෙන නමින් හඳුන්වන ලෙන් බිත්ති අතර ශේෂව පවතී. සංසන්දනාත්මකව බැලූ කල සීගිරි, වෙස්සගිරි ආදී ක්ෂේත්‍ර සිහිගන්වන මෙම බිතු තලය අඳවන විට බොහෝ සෙයින් හායනයට ලක්ව ඇත. වර්තමාන බෝධිඝරය පිහිටා ඇති අවකාශය තුළ ජීර්ණයට ලක්ව ඇති ශෛලමය හිටි බුද්ධ ප්‍රතිමාවක් ද වේ. ශෛලීය අනුව අනුරාධපුර දෙවන භාගයට අයත් යයි සිතිය හැකි මෙය පරිමාණය අතින් මධ්‍යම ප්‍රමාණ වූවකි. හඳගල විහාරයේ ප්‍රතිමා මන්දිරය මහනුවර යුගයේ දී නිර්මාණය කොට තිබේ. අරටු සහිත දාරුමය සැකිල්ල සකසා ඒ මත මැටි උපයෝගී කර ගනිමින් ප්‍රතිමා නිර්මාණය කොට වර්ණ ගන්වා ඇත. හිටි, හිඳි හා සැතපෙන ඉරියව් ත්‍රිත්වය බුද්ධ ප්‍රතිමා නිරූපණයේ දී භාවිත කොට තිබේ. සුළු මැදිහත් වීමකින් සංරක්ෂණය කර ඇති ප්‍රධාන ස්තූපය අවකාශයේ ඉහළ ස්ථානයේ පිහිටා ඇත. මේ වටා විසිරී ඇති පුරාවස්තු අතර ශෛලමය මල් ආසන හා පැරණි ගජස්ථම්භය දක්නට ලැබේ. අනුරාධපුර මුල් භාගයේ සිට මහනුවර අවධිය දක්වා විවිධ කාල අවකාශ සිහි ගන්වමින් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධන කාර්යයන් සිදුවී ඇති බව පෙන්වා දිය හැක.

***ප්‍රමුඛ පද:*** හඳගල විහාරය, පාචීණඛන්ඩරාජිනිය, ස්මාරක, බිතුතලය, ගජස්ථම්භය

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. bs2020067@bpu.ac.lk
[2] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. bs2020058@bpu.ac.lk